# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 157/7 — 1975 අප්‍රේල් 01 වැනි අඟහරුවාද — 1975.04.01

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

එල්.ඕ.—ඕ. 10/59

**1959 අංක 16 දරන තේ (බදු සහ අපනයන පාලන) පනත**

විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යවරයා විමසා මුදල් අමාත්‍යවරයා විසින්, 1967 අංක 4 දරන පනතින් සංශෝධිත, 1959 අංක 16 දරන තේ (බදු සහ අපනයන පාලන) පනතේ 6 (1) වන වගන්තිය යටතේ සාදන ලද නියමය.

ඇන්. ඇම්. පෙරේරා,
මුදල් අමාත්‍ය.

1975 අප්‍රේල් මස 1 වන දින,
කොළඹ දී ය.

### නියමය

1. 1967 අංක 4 දරන පනතින් සංශෝධිත, 1959 අංක 16 දරන තේ (බදු සහ අපනයන පාලන) පනතේ 2 වන වගන්තිය යටතේ, කොළඹ තේ වෙන්දේසියකදී විකුණනු ලබන නැතහොත් ශ්‍රී ලංකාවෙන් අපනයන කරනු ලැබ විදේශීය තේ වෙන්දේසියක දී විකුණනු ලබන තේ වෙනුවෙන් නියම කරන ලද බද්ද—

(1) ඒ තේ විකුණනු ලබන මිල රාත්තලක් රුපියල් දෙකකුත් ශත පනහක් හෝ ඊට අඩු ගණනක් වන අවස්ථාවක, හෝ ශ්‍රී ලංකාවේ ව්‍යවහාර මුදලින් ප්‍රකාශිත විට සහ එකී වගන්තියේ (3) වන උපවගන්තියේ සඳහන් අඩු කිරීම කිරීමෙන් පසුව එම මිල එකී ප්‍රමාණය වන අවස්ථාවක, අහෝසි කළ යුතුය; තවද

(2) "එම මිල හෝ එම පනතේ 5 වන වගන්තිය යටතේ තක්සේරු කරන ලද මිල, කිලෝග්රෑමයට රුපියල් පහකුත් ශත පනහකට අධික වන අවස්ථාවක එම පනතේ 2 වැනි සහ 5 වැනි වගන්තිවල සඳහන් අනුප්‍රමාණය සහ ගණන් බැලීමේ ක්‍රමය අනුව වෙනුවට පහත සඳහන් ආකාරයට නියම කළ යුතුය. අය කළ යුතුය. ගෙවිය යුතුය.

(අ) එම අධික ප්‍රමාණය රුපියල් 4 කුත් ශත 40 කට වැඩි නොවන අවස්ථාවක බද්ද එම අධික ප්‍රමාණයෙන් එක් අඩකට සමාන විය යුතුය. තවද,

(ආ) එම අධික ප්‍රමාණය රුපියල් 4 කුත් ශත 40 කට වැඩිවන අවස්ථාවක බද්ද රුපියල් දෙකකුත් ශත විස්සකට සමාන විය යුතුය."

2. 1967 අංක 4 දරන පනතින් සංශෝධිත 1959 අංක 16 දරන තේ (බදු සහ අපනයන පාලන) පනතේ 6 (1) වන වගන්තිය යටතේ සාදන ලදුව 1974 නොවැම්බර් මස 07 වන දින අංක 136/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද්දා වූ හා ඉන් අනතුරුව සංශෝධනය කරන ලද්ද වූ නියමය මෙයින් ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබේ.


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

1 A——ඒ. 13532—4,325 (75/04)